# රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# උපායමාර්ගික සැලසුම

# 2017 - 2019

# පටුන

**1. හැඳින්වීම** ........ 4

**2. උපායමාර්ගික සැලැස්මක අවශ්‍යතාව** ........ 4

**3. උපායමාර්ගික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය** ........ 5

**4. ආයතනික සන්දර්භය** ........ 5

4.1 සංවිධානයෙහි ඉතිහාසය ........ 5

4.2. සංවිධානයෙහි වත්මන් තත්ත්වය ........ 7

**5. බාහිර සන්දර්භ විග්‍රහය** ........ 8

5.1 දේශපාලනික සන්දර්භය ........ 8

5.2. නෛතික සන්දර්භය ........ 9

5.3. සමාජ සන්දර්භය ........ 9

**6. දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම්** ........ 10

6.1 දැක්ම ........ 10

6.2 මෙහෙවර ........ 10

6.3 වටිනාකම් ........ 10

**7. උපායමාර්ගික අරමුණු** ........ 11

7.1 වධහිංසාවට ලක්වූ වින්දිතයින්, සම්බන්ධිත නීතිවිරෝධී ඝාතන, අතුරුදහන්වීම් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වෙනුවෙන් යුක්තිය ලබාගැනීම සඳහා කේවල් කිරීම ........ 11

7.2. වධහිංසාව සහ නීති විරෝධී ඝාතන ඇතුළුව මානව හිමිකම් උල්ලංඝනයන්ට එරෙහිව වින්දිත සහ ප්‍රජා ක්‍රියාකාරිත්වය ........ 12

7.3. ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණයේ ස්වාධිනත්වය, මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය සහ වගවීම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ අධිකරණ ප්‍රතිසංස්කරණ හරහා පෝෂණය කිරීම ........ 12

7.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හරහා ජනවාර්ගික අර්බුදයට විසඳුම් සෙවීම පිණිස මහජන ව්‍යාපාරයක් සහ සිවිල් සමාජ සන්ධානයක් ගොඩනැඟීම 12

7.5. ආයතනික ඉගෙනුම සහ සංවර්ධනය ........ 14
**8. හරස් තේමාවන්** ........ 15
8.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ විවිධත්වය ප්‍රධාන ප්‍රවාහයට ගැනීම ........ 15
8.2. මාධ්‍යය ........ 15
**9. වැඩසටහන් ප්‍රවේශයන් (මූලික ප්‍රවේශයන් )** ........ 16
**9.1. රජය සහ ආණ්ඩු යාන්ත්‍රණය සමඟ ගනුදෙනු කිරීම (ආණ්ඩුව සමඟ ගනුදෙනු කිරීම)** ........ 16
9.2. මානව හිමිකම් ආරක්ෂකයින් සවිබල ගැන්වීම ........ 16
9.3. ජාලගතවීම ........ 17
**10. අපගේ ඉලක්ක ප්‍රදේශ** ........ 18
**11. සංවිධානයික ව්‍යුහය** ........ 19
........ 19

## 1. හැඳින්වීම

රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය (රයිට් ටූ ලයිෆ්) රට තුළ නීතියේ ආධිපත්‍යය, සමානාත්මතාවය සහ සියල්ලන්ගේ අභිමානයට අදාළව දිගු කාලීන ප්‍රජාතාන්ත්‍රීකරණය සහ දේශපාලනික සහ සමාජයීය පරිවර්තනය කෙරෙහි කටයුතු කරන ශ්‍රී ලාංකීය මානව හිමිකම් සංවිධානයකි. අප සංවිධානයෙහි කාර්යය පදනම් වී ඇත්තේ අපගේ ඉතිහාසය සහ අයිතිවාසිකම් ක්‍රියාවාදය, සජීවීකරණය, ජාලකරණය සහ වින්දිතයින් සහ ඔවුන්ගේ පවුල්වලට වන්දි සහ යුක්තිය ලබාගැනීමේ සටන වෙනුවෙන් සහාය දීමට කෙරෙන උද්දේශනයෙහි අත්දැකීම් මතය.

රයිට් ටූ ලයිෆ් හි කාර්යය සහ ඉදිරි උපායමාර්ගය වෙත මඟ පෙන්වන්නේ ප්‍රජා මූලික ක්‍රියාකාරීත්වයේ සිට ජාතික සහ ජාත්‍යන්තර කේවල් කිරීම දක්වා දිවෙන සියළු මට්ටම්වල කටයුතු කර ශ්‍රී ලංකාව තුළ වසර ගණනාවක් ඔස්සේ ලත් අත්දැකීම්වලින් උගත් ප්‍රායෝගික පාඩම් ය. රයිට් ටූ ලයිෆ් මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ වින්දිතයින් හට යුක්තිය සහ සහන ගෙන ඒමට මෙන්ම, ප්‍රතිපත්ති සහ භාවිතයන්ට ධනාත්මක සහ තිරසාර වෙනස්කම් ගෙන ඒමට දිවිගලවාගත් වින්දිතයින්, මානව හිමිකම් ආරක්ෂකයින්, අනෙකුත් මානව හිමිකම් සංවිධාන සහ රාජ්‍ය යාන්ත්‍රණ සමග කටයුතු කරනු ඇත. මෙම උපායමාර්ගික සැලැස්ම සංවිධානයෙහි උපාය මාර්ගික අරමුණු, දැක්ම, මෙහෙවර සහ වටිනාකම්වලින් දැනුවත්ව ඇති අතර ඒවා පිළිබිඹු කරයි.

## 2. උපායමාර්ගික සැලැස්මක අවශ්‍යතාව

2014 - 2016 සඳහා අප විසින් සකසන ලද උපායමාර්ගික සැලැස්මට අදාල දේශපාලන පසුබිම මේවන විට වෙනස්ව ඇති නිසාත්, එම වෙනස හරහා සිවිල් සමාජ ක්‍රියාකාරීත්වයේ සැලකිය යුතු වෙනස්කම් ඇතිවී තිබීමත්, නව රජය විසින් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ දැනටමත් ආරම්භකර ඇති නිසාත්, වර්තමාන දේශපාලන පසුබිම තුළ අපගේ ඉදිරි ක්‍රියාකාරීත්වය සඳහා උපායමාර්ගික සැලැස්මක් අපට අවශ්‍යව තිබේ. මෙහිදී අවධානය යොමු කළ කරුණු වුයේ;

1 රජය නැවත ජාතිවාදී වීම වැළැක්වීම
2 ජාතිවාදී මතවාදයන් තුරන්කර මානවවාදී අදහස් සමාජය තුළ තහවුරු කිරීම සඳහා ක්‍රියාකාරීත්වය
3 වධහිංසාව හා නීති විරෝධී ඝාතන ඇතුළු මානව හිමිකම් කඩවීම් වැළැක්වීම සඳහා නීතිමය, ප්‍රතිපත්තිමය, ආකල්පමය හා ව්‍යුහාත්මක වෙනස්කම් හා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක නිතර වීම
4 රජය හා සිවිල් සමාජ අතර මානව හිමිකම් මූලධර්ම මත පදනම් වූ ඵලදායි සම්බන්ධතා ඵලදායි වර්ධනය

## 3. උපායමාර්ගික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය

උපායමාර්ගික දිශාව සැලසුම් කිරීම සඳහා 2015 වසර අවසානයේදී සහ 2016 වසර මුල් භාගයේදී කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් වැඩමුළු කිහිපයක් පැවැත්විණි. දේශපාලනික, නෛතික, හා සමාජ සන්දර්භයන් මත පදනම් වෙමින් ගැටළු විශ්ලේෂණයක් සිදු කළ අතර, අනාගත තත්ත්වය විශ්ලේෂණය කිරීම සඳහා වර්තමාන සන්දර්භය තුළ හඳුනාගනු ලැබූ ගැටළු ඉදිරි වසර තුන තුළදී වෙනස්විය හැකි ආකාරයද සාකච්ඡා කරන ලදී. පවත්නා නව දේශපාලනික සන්දර්භය තුළ අපගේ මැදිහත්වීම්වලදී රජයේ පාර්ශවයන් සමඟ සම්බන්ධවන ආකාරය හඳුනාගැනීම සඳහා කාර්යමණ්ඩල සාමාජිකයින් සහ ප්‍රාදේශීය ක්‍රියාකාරීන් සමඟ විශේෂිත එක්දින වැඩමුළුවක්ද පැවැත්විණි. සංවිධානමය ශක්තීන් හා වැඩිදියුණු විය යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම පිණිස අභ්‍යන්තර සුපරීක්ෂාවක්ද සිදු කෙරිණි.

## 4. ආයතනික සන්දර්භය

### 4.1 සංවිධානයෙහි ඉතිහාසය

මූලාරම්භයේදී "කලාපේ අපි" යන නම යටතේ ක්‍රියාත්මක වූ මෙම සංවිධානය එහි කටයුතු අරඹන ලද්දේ 1992 දී ය. සංවිධානය අභියෝගයන් රැසකට මුහුණ දුන් අතර, පසුව රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය ලෙස ලියාපදිංචි කරන ලදී. එය වසර 2002 දී G.A. 323 ලියාපදිංචි අංකය සහිතව 2007 සමාගම් පණත අංක 07 යටතේ ලාභ නොලබන සංවිධානයක් ලෙස ලියාපදිංචි වී ඇත.

නිදහස් වෙළඳ කලාපයේ සේවකයෙකු වූ එච්.එම්. රංජිත් මහතා සහ ඔහුගේ කම්කරු නීති උපදේශක එල්. ලයනල් මහාත පැහැරගෙන ඝාතනය කිරීම ප්‍රථම වතාවට 1991 වසරේදී අනුස්මරණය කිරීම පැවැත්විණි. එතැන් පටන් වසරක් පාසා ඔක්තෝම්බර් මස 27 වන දින අතුරුදහන් වූවන් සැමරීම සඳහා වැඩසටහනක් සංවිධානය කෙරේ.

ඉන්පසු 1992 වසරේදී "කලාපේ අපි" සංවිධානය පිහිටුවන ලදී. එහි අරමුණ වුයේ, වැටුප්, සේවා පරිසරය, සහ අතුරුදහන්වීම් ආදිය ඇතුළත් වූ මූලික ඉල්ලීම් පහ ඉටුකර ගැනීමය. "අතුරුදන්වූවන්ගේ මාපිය දූ දරු සංගමය" සහ "මව් පෙරමුණ" සමග සහයෝගිත්වයෙන් කටයුතු කිරීම 1992 - 1993 කාල වකවානුවේ දී ආරම්භ කරන ලදී.

සේවකයින්ගේ නෛතික අයිතීන්වලට සම්බන්ධ ක්‍රියාකාරකම් “කලාපේ අපි” හරහා නොනවත්වා කෙරෙන අතර, සිය සේවා ස්ථානවලින් බලයෙන් පහකරන ලද අය වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කේවල් කරනු ඇත. දැනට වසර සයක් තුළ නොනවත්වා මේ වෑයම වෙනුවෙන් HIVOS විසින් ආධාර මුදල් සපයා ඇත.

වසර 1996 සහ 1998 අතර පිහිටුවා ක්‍රියාත්මක වූ සේවක කමිටුව තුළ පූර්ණ කාලීන ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණය කිරීමට තැත් දරමින් “ කලාපේ අපි” තුළ ප්‍රථම කැරැල්ල (නැගී සිටීම) සනිටුහන් කරන ලදී. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ කටුනායක පිහිටුවන ලද කාර්යාලය වසා දැමීමට සිදුවීමය. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ සාමාජික කණ්ඩායමක් විසින් “කලාපේ අපි” වෙනම සංවිධානයක් ලෙස ලියාපදිංචි කර පවත්වාගෙන යාමත් සමග, නව සම සමාජ පක්ෂයට පක්ෂපාතී වූ පිරිස්, “කලාපේ අපි සහයෝගිතාව” යටතේ වෙන්ව ක්‍රියාත්මක වීමෙන් සංවිධානය හැරවුම් ලක්ෂ්‍යයක් කරා ලඟා විය.

2000 වසරේදී, “කලාපේ අපි සහයෝගිතාව” ජාඇල නෝර්ත් පෝල් සමාගම සහ සිලෝන් ග්‍රීන් එලිවේටර්ස් සමාගමෙහි සේවකයින් මුහුණු දුන් හිරිහැර කිරීම් සහ කෲර සැළකිලිවලට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සහ අතුරුදහන් වූවන් සැමරීමට සිහිවටනයක් සීදුවේ රද්දොළුව මංසන්ධියේ ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී.

සජීවීකරණය සඳහා යොදාගත් පාරම්පරික ක්‍රමවේදයන්ගෙන් ඔබ්බට යොමුවූ ක්‍රමෝපායයට සම්බන්ධව සංවිධානය තුළ ඇතිවූ මතවාදී අරගලයෙහි ප්‍රතිඵලයක් ලෙස, සේවකයින්ගේ අයිතීන් සඳහා පමණක් කෙරෙන කේවල් කිරීමෙන් ඔබ්බට ගොස් සියළුම ප්‍රජාතන්ත්‍රවාදී අවකාශ සහ මානව හිමිකම් සඳහා උද්දේශනය කෙරෙහි ලඟාවීමේ අවශ්‍යතාව ඇතුළුව, සාමාජිකයින් කණ්ඩායමක් “කලාපේ අපි සහයෝගිතාවෙන්” ඉවත්ව, රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය පිහිටුවා ගත්හ.

හොංකොං හි පිහිටා ඇති ආසියානු මානව හිමිකම් කොමිසම රයිට් ටූ ලයිෆ් හි මූලික අවශ්‍යතා සඳහා 2002 වසර තුළ අධාර මුදල් ලබාදීමට ඉදිරිපත් වූ අතර, අඛණ්ඩව වසර හයක් සඳහා ඔවුන්ගේ දායකත්වය සංවිධානය කෙරෙහි නොනවත්වා ලබාදුනි.

2004 වසරේදී, ආසියානු මානව හිමිකම් කොමිසමෙහි සහයෝගිත්වය ඇතිව වධහිංසාවට විරෝධය පාන විශේෂ වැඩසටහනක් ලෙස “වධහිංසාවට එරෙහි මහජන සන්ධානය” ශ්‍රී ලංකාව තුළ දියත් කෙරුණි. මෙම වැඩසටහනෙහි ප්‍රතිඵලයක් ලෙස, පුළුල් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාරය සහ වධහිංසාව වැළැක්වීමේ පණත අංක 22, 1994, හට ලබාදුන් ප්‍රසිද්ධිය නිසා වධහිංසාවට එරෙහි ක්‍රියාවාදය තවදුරටත් ශක්තිමත් විය. මෙම පණත යටතේ නඩු ගොනු කිරීමට නීතිපති හට බලපෑම් කෙරුණි. තවද, මානව හිමිකම්, පොලිස්, සහ රාජ්‍ය සේවා කොමිසම් සහා ක්‍රියාවට නැංවීමට බලධාරීන් හට බලපෑම් කිරීමට හැකිවීමෙන් සංවිධානයේ ඉතිහාසයෙහි තවත් හැරවුම් ලක්ෂ්‍යයක් නිර්මාණය විය.

2006 වසරේදී, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම සහ වධහිංසා යන තේමාවන් යටතේ තවත් සංවිධාන කිහිපයක් රයිට් ටූ ලයිෆ් හි ක්‍රියාවාදයට එක් වූහ.

වසර 2007 දී තවත් සංවිධාන 17 ක් සමග සියළු වර්ගයේ අතුරුදහන්වීම් වලට එරෙහිව සන්ධානයක් පිහිටුවන ලදී. මෙම සංවිධානය උතුරෙහි සහ නැගෙනහිර සිදුවෙමින් පැවති අතුරුදහන්වීම් වලට එරෙහිව විවිධ ක්‍රියාකාරකම්වලට සහභාගි විය. මේ අතරතුර, වධහිංසාවට ලක්වූ වින්දිතයින් සහ

නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් සිටි 2004 වසරේදී ජෙරාඩ් මර්වින් පෙරේරා සහ 2006 වසරේදී සුගත් නිශාන්ත ඝාතනයත් සමග, සංවිධානය අවසන් ලෙස වටහා ගත්තේ, වඩාත් පුළුල් ප්‍රතිසංස්කරණ අවශ්‍ය බවත්, යුක්තිය උදෙසා සේවය කිරීමට නීතියේ අධිකරණයෙන් සිදුකෙරෙන ක්‍රියාවලිය පමණක් ගැන විශ්වාසය තැබීම යථාර්ථවාදී නොවන බවත්ය. මෙපමණ සීමාකාරී සන්දර්භයක් මධ්‍යයේ සේවකයින් සජීවීකරණය කිරීම අපහසු බව තේරුම්ගෙන, සංවිධානය මෙවැනි ස්වභාවයක ක්‍රියාකාරිත්වයන්හි නිරත වීමෙන් ඈත්විය.

2008 වසර තුළ බහුලව පැවති පීඩාකාරී තත්ත්වයන් යටතේ, පැතිර පවත්නා තත්ත්වයන්ට මුහුණදීම පිණිස එක්සත්ව සිටීමට තිරණය කරන ලදී. අනෙකුත් කණ්ඩායම් සමග සහයෝගිත්වයෙන් ස්වාධීන කොමිෂන් සභා සක්‍රීය කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී.

රටෙහි විවිධ දේශපාලන අදියරවලදී, ශ්‍රී ලංකාව තුළ නැගී එන දේශපාලනික අභියෝග ආමන්ත්‍රණය කිරීමට 2009 වසරේදී "නිදහසේ වේදකාව" නමින් සිවිල් සමාජ සංවිධානවල ජාලයක් සෑදීමටද, 2014 වසරේදී "වීදියේ විරෝධය" නිර්මාණය කිරීමටද රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය මූලිකත්වය ගත්තේය. නිදහසේ වේදිකාව ප්‍රධාන වශයෙන් කතා කිරීමේ සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ ජීවිතයට ඇති අයිතිය යන තේමාවන් කෙරෙහි යොමු වූ අතර, වීදියේ විරෝධය ප්‍රජාතාන්ත්‍රික සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කෙරෙහි යොමු විය. "වීදියේ විරෝධය" සිවිල් සමාජ සන්ධානය තේමාත්මක කොට්ඨාශ 15 ක් ආවරණය වන පරිදි, උපදේශක සහ සහයෝගිතා ක්‍රියාවලියක් හරහා සවිස්තරාත්මක ප්‍රතිසංස්කරණ යෝජනා කට්ටලයක් සුදානම් කළහ. මේවාට, වධහිංසාව, නීතිවිරෝධී ඝාතන සහ අතුරුදහන්වීම් ඇතුළත් වූ අතර, 2013 දී එවිට සිටි විපක්ෂ දේශපාලන පක්ෂ වෙත එය භාර දුන්හ.

අතුරුදහන් වූවන්ගේ ජාත්‍යන්තර සැමරුමට සමාන්තර සැමරුමක් ප්‍රථම වතාවට 2011 අගෝස්තු 30 වන දින වවුනියාවේදී පැවැත්විණි. තවද, ප්‍රධාන සංවිධාන 9 ක සහයෝගිත්වයෙන් ප්‍රථම වතාවට ශ්‍රී ලංකාව පිළිබඳ ඒකාබද්ධ වාර්තාවක් එක්සත් ජාතීන්ගේ වධහිංසා කමිටුවට ඉදිරිපත් කළ අතර, සංවිධානයෙහි නියෝජිතයින් දෙදෙනෙක් ද මෙම කමිටුවට සහභාගි වූහ.

අතුරුදහන්වීමේ විෂයට අදාළව උතුරු සහ නැගෙනහිර කණ්ඩායම් සමග අත්වැල් බැඳ ගැනීමට අවස්ථාව උදා වූයේ 2012 වසරේය.

සංවිධානයේ ඉතිහාසය විශ්ලේෂණය කිරීමේදී, රයිට් ටූ ලයිෆ් ආරම්භයේදී අතුරුදහන්වීම් සහ වධහිංසාවට එරෙහි ක්‍රියාකාරිත්ව ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වූ බවත්, පසුව ප්‍රජාතාන්ත්‍රික අවකාශය පුළුල් කිරීම සහ මානව හිමිකම් වෙත නැඹුරු වූ බවත් පැහැදිලි වේ.

## 4.2. සංවිධානයෙහි වත්මන් තත්ත්වය

රයිට් ටූ ලයිෆ් නීතියේ ආධිපත්‍යය ප්‍රගමනය කිරීම හරහා, ප්‍රාදේශීය, කලාපීය, ජාතික සහ අන්තර්ජාතික මට්ටම්වල දැනුවත් කිරීම් සහ වධහිංසා සහ අතුරුදහන්වීම්වලට එරෙහිව උද්දේශන ව්‍යාපාරවල නිරත වී ඇත. වධහිංසාවන්ට ලක්වූ වින්දිතයින් හට නීතිමය සහාය ලබාදීම, වින්දිතයින් හරහා ගම්මානවල දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, මහජන දැනුවත්කම නඟා සිටුවීමට වීදි ව්‍යාපාර, මානව හිමිකම් ආරක්ෂකයින් වීම සඳහා වින්දිතයින් සහ යෞවනයින් පුහුණු කිරීම සහ සංවිධානය කිරීම, සහ මානව හිමිකම් ගැටළු ගැන මාධ්‍ය ප්‍රකාශන නිපදවීම, සංවිධානයේ මැදිහත්වීම් වලට ඇතුළත් වේ.

ජාත්‍යන්තරව, ආසියානු මානව හිමිකම් කොමිසම (AHRC) ආසියානු නෛතික සම්පත් මධ්‍යස්ථානය (ALRC), වධහිංසාවට ලක්වූ වින්දිතයින් සඳහා වූ පුනරුත්ථාපන සහ පර්යේෂණ මධ්‍යස්ථානය (RCT), සහ වධහිංසාවට ලක්වූ වින්දිතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා අරමුදල (UNVFVT) මැනේජ්මන්ට් සිස්ටම්ස් ඉන්ටර්නැෂනල් හි (MSI) වෘත්තීය සහ ආයතනික ධාරිතා වර්ධන වැඩසටහන (SPICE) සහ නීලන් තිරුචෙල්වම් භාරය (NTT) යන මේවා සමග රයිට් ටු ලයිෆ් ඉතා සමීපව කටයුතු කර ඇත.

# 5. බාහිර සන්දර්භ විග්‍රහය

## 5.1 දේශපාලනික සන්දර්භය

ශ්‍රී ලංකාව 1971 සහ 1987 - 1989 යන වර්ෂවල තරුණ නැගී සිටීම් දෙකකට මුහුණ දී ඇත. තවද 1983 සිට රජය සහ ද්‍රවිඩ සටන්කාමීන් අතර සිවිල් යුද්ධයකට රට ඇද වැටී ඇති අතර, 2009 වසරේදී එය තීරණාත්මකව හමුදාමය ලෙසින් පරාජයට පත්කරන ලදී. රජය විසින් මෙම නැගී සිටීම් සමග කටයුතු කිරීම සඳහා අධිකරණ, ව්‍යවස්ථාදායී සහ හමුදාමය යාන්ත්‍රණ භාවිතා කරන ලදී. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත (PTA), හදිසි නීති රෙගුලාසි (ER) සහ වධහිංසා, විසම්මුතිය මර්ධනය කිරීම සඳහා පිළිවෙලින් පැවති ආණ්ඩු විසින් දිගුකලක් තිස්සේ භාවිතා කළ රාජ්‍ය මෙවලම් විය. දහස් ගණන් හට සිය ජීවිත අහිමිවී, අවතැන් වී සහ කඳවුරුවල හෝ මිතුරන් සහ පවුල් සමග දිවිගෙවීමට සිදුවිය. මීට අමතරව, දහස් ගණනක්ද කිසිදු හෝඩුවාවක් නොමැතිව අතුරුදහන් වූහ. 2009 වසරේ යුද්ධය අවසන් වූ විට, ඉඩම් පාලනය සහ ආර්ථික ක්ෂේත්‍රය සඳහා ද හමුදා ප්‍රතිපාදිතය භාවිතා කෙරුණි. අධිකරණය සහ පරිපාලනමය ව්‍යුහයන් ප්‍රබල ලෙස දේශපාලනීකරණය වී තිබුණි.

2015 වසරේදී ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණ වලින් පසුව ශ්‍රී ලංකාව තුල අනපේක්ෂිත වෙනසක් දේශපාලනික ක්ෂේත්‍රය තුළ දක්නට ලැබිණි. මෙහෙයුම් වටපිටාව සිවිල් සමාජ ක්‍රියාවාදය සඳහා වඩාත් හිතකර වන අතර, මෙය ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිලාභ වඩාත් ශක්තිමත් කිරීම සහ පාලනය තුළ වැඩි වැඩියෙන් ප්‍රජා ගනුදෙනු සඳහා හොඳම අවස්ථාවකි. සුභදායක මෙහෙයුම් අවකාශය සහ පිළිගැනීම තුළින් පාලනය සහ සංහිඳියාව යන ක්‍රියාවලියන් තුල ක්‍රියාකාරී භූමිකාවක් සිවිල් සමාජය හට ලබා දී ඇත.

ජාතික සමගි ආණ්ඩුවක් තුළ කටයුතු කරන ප්‍රධාන පක්ෂ දෙක අතර පවතින වර්තමාන දේශපාලනික සංයෝගය සාර්ථක වී අඛණ්ඩව පැවතුනහොත්, පාලනය සහ සංහිඳියාව සඳහා කල් පවත්නා විසඳුම් කරා ලඟාවිය හැක. කෙසේවෙතත්, ජාතික සමගි ආණ්ඩුව අස්ථාවර වුවහොත්, ජාතිවාදය සහ ආගමික අන්තවාදය හිස ඔසවා, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලි නැවතී, සංහිඳියාව සඳහා කල්පවත්නා විසඳුම් ප්‍රමාද වේ.

## 5.2. නෛතික සන්දර්භය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය සම්මත කර ගැනීමත් සමග, ස්වාධීන කොමිෂන් සභා පිහිටුවා ඇත. ආණ්ඩුව වධහිංසාවට එරෙහි ප්‍රඥප්තිය සඳහා වූ විකල්ප ප්‍රෝටොකෝලය ස්ථිර කිරීමට පොරොන්දු වී ඇත.

ආණ්ඩුව, වෙනත් කාරණා අතර, සත්‍යය සෙවීම, යුක්තිය, වන්දි ලබාදීම සහ නැවත සිදුනොවීම යන මේවායින් සමන්විත සංක්‍රාන්ති යුක්ති රාමුවක් තුළ සංහිඳියාවේ ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා කටයුතු කරමින් සිටියි. සත්‍ය කොමිෂන් සභාව පිහිටුවීම සහ ක්‍රියාවේ යෙදවීම, අතුරුදහන් වූවන්ගේ කාර්යාලය, විශේෂ අධිකරණ යාන්ත්‍රණ, වන්දි ගෙවීම් සඳහා කාර්යාලයක් මෙන්ම විශ්වාසය ගොඩනැඟීමේ පියවර රැසක් මෙයට ඇතුළත් වේ. ආණ්ඩුව විසින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අභ්‍යාසයක්ද ආරම්භ කර ඇත.

2015 වසරේදී ආණ්ඩුව වෙනස්වීමෙන් පසු, පෙර පැවති පද්ධතියට (ක්‍රමයට) සාපේක්ෂව අධිකරණය තුළ පැහැදිලි ස්වාධීනත්වයක් පවතී. මහේස්ත්‍රාත්වරු සහ පොලීසිය වඩාත් ස්වාධීන බවක් පෙනෙන්නට තිබෙන අතර, විශේෂ අවස්ථා සම්බන්ධයෙන් ඉක්මන් විමර්ශන පවත්වයි.

## 5.3. සමාජ සන්දර්භය

නව දේශපාලන තත්ත්වය පුරවැසි සහභාගිත්වය සමඟ ප්‍රධාන ක්‍රියාවලීන් රැසක් තහවුරු කර තිබේ. උදාහරණ වශයෙන්, පිහිටුවීමට යන සමහර යාන්ත්‍රණ සහ ආයතන ජනතාවගේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් පිළිබිඹු කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා වූ මහජන නියෝජන කමිටුව හරහා මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියක් ආණ්ඩුව විසින් පිහිටුවීම සහ සංහිඳියා යාන්ත්‍රණය සඳහා අදහස් විමසීමේ (උපදේශක) කාර්යසාධන බලකායක් පිහිටුවීම, ගත හැක. මෙම ක්‍රියාවලියන් දිවයින පුරා ක්‍රියාවේ යෙදවීමෙන් පුරවැසියන් හට ලිඛිත හෝ වාචික කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව සැපයේ. කෙසේවෙතත්, මෙම ක්‍රියාවලීන් අභියෝගවලින් පිරී ඇත. මෙහිදී නොසළකා හැරිය නොහැකි කරුණක් වන්නේ කොන්කිරීමට ලක්වූ ජනතාවට වඩා කොළඹ - කේන්ද්‍ර කරගත් ප්‍රභූ දෘෂ්ටි කෝණය, වඩාත් ප්‍රබල හඬක් සහිත වීමය.

ආණ්ඩුවෙහි ප්‍රතිසංස්කරණ සහ වත්මන් දේශපාලනික උරුව (ආචාර විධි) දිගටම ගෙන ගියහොත්, රාජ්‍ය ව්‍යුහය, අධිකරණ සහ නීතියේ ආධිපත්‍යය කෙරෙහි මහජන විශ්වාසය සහ පැහැදීම වැඩිවීමක් සහ පොලීසිය ගැන ඇති සෘණාත්මක ආකල්පවල අඩුවීමක් අපි බලාපොරොත්තු වෙමු. කෙසේවෙතත්, පැහැදිලි දේශපාලන අධිෂ්ඨානයක් නොමැති තත්ත්වයක් තුළ, කාලයත් සමග මාධ්‍ය ස්වාධීනත්වය අඩුවී මෙම ආණ්ඩුවෙහි ප්‍රජාතාන්ත්‍රික ව්‍යාපෘතියට සෘජු අභියෝගයක් එල්ල කරයි. තවද, ජනවාර්ගික අර්බුදයට හේතු, සුළු ජාතීන්ගේ සහ අවදානමට ලක්වූ කණ්ඩායම්වල අපේක්ෂා, සහ ව්‍යුහාත්මක අසමානාත්මතාවය ආමන්ත්‍රණය කිරීමට සාධනීය විසඳුමක් නැතහොත්, ජනවාර්ගික ආතතිය, ජාතිවාදය සහ ජාතිකවාදය නැවත පණ ගැන්වීමේ ප්‍රතිඵලයක් ලෙස ජනවාර්ගික/ ආගමික/ ආර්ථික මං ඔස්සේ කණ්ඩායම් තවදුරටත් ධ්‍රැවීකරණය විය හැකිය.

සිවිල් ක්‍රියාකාරිත්වය සහ සහභාගිත්වය සඳහා අවකාශය සහ අවස්ථාව පවතින්නේ හිතකර දේශපාලනික සහ සමාජ පරිසරයක වේ. ජාතිවාදය, නොඉවසීම සහ විසම්මුතිය මැඩපැවත්වීම රාජ්‍යය සහ සිවිල් සමාජය අතර සහයෝගීතාවයෙහි පදනමට හානි කර විය හැකි අතර, රට තුළ සමාජ-දේශපාලනික, ආර්ථික, ජනවාර්ගික සහ ආගමික විවිධත්වය තුළ ධ්‍රැවීකරණයට දායක විය හැක.

# 6. දැක්ම, මෙහෙවර සහ මූලික වටිනාකම්

## 6.1 දැක්ම

බහු වාර්ගික හා බහු ආගමික සහ, සාධාරණත්වය, සමානාත්මතාව, ජීවිතයට ඇති ගරුත්වය සුරකින පුරවැසි සමාජයක්

## 6.2 මෙහෙවර

වධහිංසාව, නීතිවිරෝධී ඝාතන ඇතුළු මූලික අයිතිවාසිකම් කඩකිරීම්වලට එරෙහි, ජාතික සමඟිය සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින සමාජයක් ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාකාරී මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගතවීම

## 6.3 වටිනාකම්

සංවිධානය සිය ක්‍රියාකාරිත්වයේදී පහත දැක්වෙන අගයන් මත ක්‍රියාකාරී වන අතර එම අගයන් සංවිධානයේ පුද්ගල හා පොදු ක්‍රියාකාරීත්වයන්හිදී පිළිබිඹු වනු ඇතඃ

- ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සංවේදී බව

  සියළු වර්ගවල ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතා වලට ගරු කිරීම.

- අපක්ෂපාතීත්වය

  වධහිංසාව, නීති විරෝධී ඝාතන හෝ අතුරුදහන් වීම් වැනි මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදුවන විට, අපි දේශපාලන පක්ෂ බැඳීම්, ජනවාර්ගිකත්වය, කුලය, ආගම හෝ තත්ත්වය සැළකිල්ලට නොගෙන අපක්ෂපාතීව ක්‍රියා කරමු.

- විනිවිදභාවය

  ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් ජාල තුළ ආර්ථික සහ විශ්වාසය පිට රඳා පවත්නා විනිවිදභාවය

- වගවීම

  ප්‍රජාව, ප්‍රතිලාභී කණ්ඩායම්, ආධාර අරමුදල් සපයන්නන් සහ පාර්ශ්වකරුවන්ට වගවීම

# 7. උපායමාර්ගික අරමුණු

## 7.1 වධහිංසාවට ලක්වූ වින්දිතයින්, සම්බන්ධිත නීතිවිරෝධී ඝාතන, අතුරුදහන්වීම් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වෙනුවෙන් යුක්තිය ලබාගැනීම සඳහා කේවල් කිරීම

වධහිංසාව, නීතිවිරෝධී ඝාතන ඇතුළු මූලික අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධව මූලික නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හා යුක්තිය ලබා ගැනීම සඳහා මැදිහත්වීම මූලික වේ. වින්දිතයින්ට යුක්තිය ලබා ගැනීම සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කේවල් කිරීමද මෙමඟින් අරමුණු කෙරේ. වධහිංසාව වැළැක්වීම සඳහා පොලිස්, නීතිපති, අධිකරණ ආදී ක්ෂේත්‍රයන්හි ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීමට මෙන්ම, විශේෂයෙන්ම වධහිංසාවට එරෙහි වෛකල්පිත ප්‍රොටෝකෝලය රජය අත්සන් තැබීමට හා එම සම්මුතීන්ට අනුව ප්‍රායෝගිකව රාජ්‍ය කටයුතු මෙහෙයවීමට බලපෑම් කිරීම.
මානව හිමිකම් කොමිෂන් සභාව හා පොලිස් කොමිෂන් සභාවෙහි විමර්ශන විධිමත් කිරීම, පැමිණිලි කෙටි කලකින් අසා නිම කිරීම, සාධාරණ නිර්දේශ ලබාදීම සහ, එම නිර්දේශ අනිවාර්යයෙන් ක්‍රියාත්මක කරවීමේ ක්‍රමවේදයන් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම. ඒවායෙහි ක්‍රියාකාරීත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීම තුළින් එම ආයතන වගවීමෙන් සහ ඵලදායී ලෙස ක්‍රියාත්මකවන බවට තහවුරු කිරීම.

එමෙන්ම කොමිෂන් සභා සමඟ ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් නිල සම්බන්ධතාවන් ඇතිකර ගැනීම හා ස්වාධීන කොමිෂන් සභාවන්හි වැදගත්කම හා කාර්යභාරය පිළිබඳ මහජනයා දැනුවත් කිරීමද මෙයට ඇතුළත්ය.

වධහිංසාවට එරෙහි කමිටුවෙහි නිර්දේශ අනුගමනය කිරීම, වධහිංසාව ශූන්‍ය ඉවසා දැරීම සඳහා සාමූහිකව පෙනී සිටීම, සහ වධහිංසාව වනාහි පුරවැසියෙකු ලෙස මඟහැරිය නොහැකි අයිතියක් බවට ක්‍රියාකාරී සංවාදයක් ගොඩනැඟීම කෙරෙහි අවධානය යොමුකරනු ඇත.

torture is a non-derogale right

## 7.2. වධහිංසාව සහ නීති විරෝධී ඝාතන ඇතුළුව මානව හිමිකම් උල්ලංඝනයන්ට එරෙහිව වින්දිත සහ ප්‍රජා ක්‍රියාකාරීත්වය

වධහිංසාව, නීතිවිරෝධී ඝාතන ඇතුළු මූලික අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධව තොරතුරු රැස් කිරීම පොලිස් වධහිංසාවට එරෙහි ක්‍රියාකාරීත්වයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික හා නෛතික සහාය ලබාදීම, විශේෂයෙන්ම සිසුන් හා තරුණ ක්‍රියාකාරීන් ආමන්ත්‍රණය සඳහා අධ්‍යාපනික වැඩසටහන් සහ සමාජ සන්නිවේදන මාධ්‍යයන් පදනම්කරගත් ක්‍රියාකාරකම් මෙන්ම, මානව හිමිකම් උල්ලංඝනයවීම් සහ වධහිංසාවන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මකවන ක්‍රියාධරයින් කණ්ඩායමක් බිහිකිරීම මෙයට ඇතුළත් වේ.

## 7.3. ප්‍රජාතන්ත්‍රවාදය, අධිකරණයේ ස්වාධීනත්වය, මානව හිමිකම්, නීතියේ ආධිපත්‍යය සහ වගවීම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සහ අධිකරණ ප්‍රතිසංස්කරණ හරහා පෝෂණය කිරීම

වගවීමෙන් යුතු අධිකරණ පද්ධතියක් පුරවැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහතික කරයි. මේ වෙනුවෙන්, අවශ්‍ය කරන අධිකරණ ප්‍රතිසංස්කරණ සහ ආයතනික වෙනස්කම් වලට පක්ෂව පෙනී සිටිනු ඇත. මීට අමතරව, රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය රට තුළ සියළු ජනතාවගේ හිමිකම් ආරක්ෂා කරන, ප්‍රවර්ධනය කරන, සහ සුරකින නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා කතා කරනු ඇත. බලය බෙදාගැනීම සහ ජනතාවගේ පරමාධිපත්‍යය පිළිබිඹු කෙරෙන යෝග්‍ය ආයතනික යාන්ත්‍රණයක් හරහා ප්‍රජාතාන්ත්‍රික විසඳුම් සෙවීම වෙනුවෙන් කේවල් කරනු ඇත.

## 7.4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය හරහා ජනවාර්ගික අර්බුදයට විසඳුම් සෙවීම පිණිස මහජන ව්‍යාපාරයක් සහ සිවිල් සමාජ සන්ධානයක් ගොඩනැඟීම


ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින හා ක්‍රියාකාරීවන මහජන ව්‍යාපාරයක් ගොඩනැඟීම සඳහා සිවිල් සමාජයේ ඒකාබද්ධතාවයක් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීමට කටයුතු කිරීම. දිනාගත් ප්‍රතිසංස්කරණ පිළිබඳව මහජන අවබෝධය වැඩි කිරීම හා එම

ප්‍රතිසංස්කරණ ලබා ගැනීම වෙනුවෙන් ප්‍රායෝගිකව මැදහත්වන පිරිසක් නිර්මාණය කිරීම. තවද, සමාජයේ ස්ථාපිතව ඇති ප්‍රතිගාමී මත වෙනුවට විශේෂයෙන් ජනවාර්ගික සමඟිය, මානව හිමිකම්, මානව හිමිකම් සංවිධාන ක්‍රියාකාරීත්වය පිළිබදව ඉදිරිගාමී මතයන් තහවුරු කිරීම.

තවද, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ජනමතයක් ගොඩනැගීමට ප්‍රජාවන් දැනුවත් කිරීමද මෙමඟින් අපේක්ෂිතය.

## 7.5. ආයතනික ඉගෙනුම සහ සංවර්ධනය

වඩාත් ඵලදායී ලෙස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා ආයතනික ඉගෙනුම මෙන්ම කාර්ය මණ්ඩලයට අවශ්‍ය දැනුම හා කුසලතා වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම. අපගේ පසුගිය ක්‍රියාකාරීත්වයන් සම්බන්ධයෙන් ඇගයීමක් කිරීම සහ ඒවා ප්‍රකාශන වශයෙන් එළිදැක්වීම, , කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනයවන වැඩසටහන් සඳහා සහාය දැක්වීම, මාධ්‍ය ක්‍රියාකාරීත්වය සහ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ මාධ්‍ය භාවිතය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම, භාෂා දැනුම වර්ධනය සඳහා සහාය දැක්වීම සහ සේවක කණ්ඩායමක් බිහි කිරීම මෙයට ඇතුළත්ය.



# 8. හරස් තේමාවන්

## 8.1 ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ විවිධත්වය ප්‍රධාන ප්‍රවාහයට ගැනීම

අපගේ කටයුතු කරගෙන යාමේදී අපගේ කාර්ය මණ්ඩලයේ සහ අප සම්බන්ධ වන පුද්ගලයින්ගේ දායකත්වයන්, දෘෂ්ටි කෝණයන් සහ අත්දැකීම් තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකය අපි හඳුනාගනිමු. පිරිමි, ගැහැණු හෝ සංක්‍රාන්ති ලිංගික රාමු වේවා, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අනන්‍යතාවය යනු, පුද්ගලික අත්දැකීම් මෙන්ම අයිතීන් සහ පුරවැසිභාවයට ප්‍රතිචාර වේ. අවශ්‍යතා හඳුනාගැනීමේදී, නිර්මාණය කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී සහ අපගේ සියළු වැඩසටහන් අධීක්ෂණය කිරීමේදී සහ උද්දේශන ව්‍යාපාර තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ විවිධත්වය ප්‍රධාන ප්‍රවාහයට ගැනීමට අප අරමුණු කර ගනිමු. වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පැන නැගිය හැකි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සහ විවිධත්වයේ ගැටළු අපි ආමන්ත්‍රණය කරමු.

ප්‍රධාන වශයෙන් වධහිංසාවට ලක්වූ වින්දිතයින් සහ කෲර, අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙලෙසෙන සැළකිලි සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන් සහාය ලබාදීමේදී, පිරිමින් සහ කාන්තාවන්ගේ සුවිශේෂී අත්දැකීම් සහ අවදානම් තත්ත්වයන්ට අපි සංවේදී වෙමු. අප කටයුතු කරන වධහිංසාවට ලක්වූ වින්දිතයින්ගෙන් බහුතරය පිරිමින් වන අතර, සහන සහ යුක්තිය පිණිස ඔවුන්ගේ සටනට සහාය දීමේදී පවුල්වල කාන්තා සාමාජිකයින් සමඟ ඉතා සමීපව අපි වැඩ කරමු. මෙහිදී, අර්ථවත් ප්‍රවේශයන් හඳුනාගැනීම සහ ක්‍රියාත්මක කිරීම පහසුකිරීම වෙනුවෙන් අපි මෙම පුද්ගලයින් මුහුණ දෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවයට විශේෂිතවූ ගැටළු වලට සංවේදී වී ඔවුන්ගේ අයිතීන් තහවුරු කිරීමට කටයුතු කරමු.

## 8.2. මාධ්‍යය

අපගේ මාධ්‍ය සහ සන්නිවේදන මැදිහත්වීම් අපගේ උද්දේශනයෙහි ප්‍රධාන අංගයකි. අපගේ මාධ්‍ය නිමැවුම් වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ප්‍රධාන ප්‍රේක්ෂකයින් වෙත ලඟාවීමට දායක වේ. වඩාත් විශේෂිත වූ ප්‍රේක්ෂක ජනතාවක් ඉලක්ක කරගත් පණිවුඩ, සහ බහුවිධ ප්‍රේක්ෂකයින් සඳහා මුද්‍රිත සහ අන්තර්ජාලය තුළ මාධ්‍ය නිමැවුම් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වෙමු. මෙම බහුවිධ ප්‍රේක්ෂකයින් නම්, බිම් මට්ටමේ ප්‍රජාවන්, යෞවනයින්, ස්වේච්ඡා ක්‍රියාකාරීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ජාල පාර්ශ්වකරුවන්, අනෙකුත් සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන වේ. අපගේ ත්‍රෛ භාෂික, මුද්‍රිත, ප්‍රධාන ප්‍රවාහයේ සහ අන්තර්ජාලයට සම්බන්ධ සන්නිවේදන හරහා අපගේ කටයුතු වටා වැඩි දැනුවත් වීමක් ඇතිකිරීමට, මහජන සහාය බල මුළු ගැන්වීම සහ සම-අදහස් සහිත පුද්ගලයින්ගේ ජාලයක් ගොඩනැගීම, සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ඉලක්ක කිරීමට අපි අරමුණු කර ගනිමු.

# 9. වැඩසටහන් ප්‍රවේශයන් (මූලික ප්‍රවේශයන් )

## 9.1. රජය සහ ආණ්ඩු යාන්ත්‍රණය සමඟ ගනුදෙනු කිරීම (ආණ්ඩුව සමඟ ගනුදෙනු කිරීම)

පවත්නා අලුත් දේශපාලනික සන්දර්භය තුළ සිවිල් සමාජ සංවිධානයන් වෙත ඇති අවකාශය සැලකිල්ලට ගනිමින්, අවම වශයෙන් අපගේ ප්‍රධාන වැඩසටහන් ක්ෂෙත්‍රයන්හිදී රජය සහ ආණ්ඩු යාන්ත්‍රණය සමඟ විමර්ශනාත්මකව හා සාධනීයව මැදිහත්වීමට අපේක්ෂා කරනු ලැබේ. අපගේ ස්වාධීනත්වය තහවුරු කරමින්, ආයතනික ප්‍රතිපත්ති, අගයන් හා ප්‍රමුඛතාවන් මත පදනම්ව, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සඳහා සහාය විය හැකිය. මෙහිදී මැදිහත්වීමේ ස්වභාවය, පවතින සන්දර්භය තුළ බිම් මට්ටමේදී තීරණය කළ යුතුය. මැදිහත්වීමෙහි කොන්දේසි මාලාවක්ද සකස්කර ගැනීම සුදුසු විය හැකිය.

මෙම මැදිහත්වීම මූලිකවම ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කිරීමට සහ එම ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණය කිරීම සඳහාය. ප්‍රතිපත්ති සම්පාදනයට අපගේ ස්ථාවරයන් හා ඉල්ලීම් ඇතුළත්වන්නා වු නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කිරීම, ඒවා බිම් මට්ටමේදී ක්‍රියාත්මකවන බව තහවුරු කිරීම හා ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම ආදිය මෙයට ඇතුළත්ය.

මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිසම ආදී වු රාජ්‍ය යාන්ත්‍රණයන් සමඟ ජාතික මට්ටමේදී මෙන්ම දිස්ත්‍රික් මට්ටමින්ද නිරන්තර සම්බන්ධයක් පවත්වා ගැනීම මෙන්ම, ක්‍රියාකාරීත්වයන් අධීක්ෂණය කිරීම තුළින් මානව හිමිකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට රජය වගවන බව තහවුරු කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ. එමෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයල අධිකරණ අමාත්‍යාංශයල ජාතික සංවාද අමාත්‍යාංශය ආදී අදාල අමාත්‍යාංශ වෙතද ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අපගේ යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා සුදුසු ඉඩක් නොලැබෙන්නේ නම් ඒ පිළිබඳව කේවල් කිරීමටද අවස්ථාව තබාගත යුතුව ඇත.

## 9.2. මානව හිමිකම් ආරක්ෂකයින් සවිබල ගැන්වීම

අපගේ ප්‍රතිඵල සාක්ෂාත්කරණය සඳහා, අන්තර්ගත කරන සහ ඉලක්කගත සමාජ සජීවීකරණය සහ ක්‍රියාකාරී පුරවැසි බව අවශ්‍ය වේ. මෙය ඉටුකර ගැනීම පිණිස, බිම් මට්ටමේ ක්‍රියාකාරීන් කණ්ඩායමක් බලදායී කිරීම කෙරෙහි අවධානය යොමුකරනු ඇත. වින්දිත කණ්ඩායම්, දේශිය මානව හිමිකම් ආරක්ෂකයින් සහ තරුණ කණ්ඩායම් හට ඔවුන්ගේ ප්‍රජාව තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට සහ සුරැකීමට ඇති ඔවුන්ගේ විභවය තේරුම් ගැනීම මෙයට ඇතුළත් වේ. මෙම ක්‍රියාකාරීන් ප්‍රාදේශිය මට්ටමේ ක්‍රමානුකූල මැදිහත්වීම් වලට සහාය දීම, දැනුවත්වීම සහ අයිතීන් පිළිබඳ විඥානය ඉහළ


දැමීම, ප්‍රජාව තුළ තම තමන් අතර සහ ප්‍රාදේශිය සහ ජාතික මට්ටමේ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර, උපායමාර්ගික ජාල සෑදීම සඳහා සහාය ලබාදෙනු ඇත. විඥානය, දැනුවත් වීම සහ කුසලතා ගොඩනැංවීම හරහා බලගැන්වීම, වින්දිත කණ්ඩායම් හට වධහිංසා හෝ අනෙකුත් උල්ලංඝන වෙනුවෙන් නෛතික සහන සෙවීමෙන් ලබාගත් ජයග්‍රහණ නොනැසී පවත්වාගෙන යාමටත්, වැඩි යුක්තිය සහ වගවීම ඉටුකර ගැනීමට උත්සාහ දැරීමටත්, උපකාරී වේ.

බලගැන්වීමේ ප්‍රවේශය අප කටයුතු කරන අන්දමට රාමුවක් සපයන අතර, අප කටයුතු කරන අන්දම නිර්ණය කරයි. අදාළ සහ තිරසාර බලපෑමක් සාක්ෂාත් කිරීම සඳහා *නිපැයුම* මෙන්ම *ක්‍රියාවලිය* වැදගත් වන බව අපි තේරුම් ගනිමු.

## 9.3. ජාලගතවීම

අප අනුගමනය කරන අයිතීන් පාදක කරගත් ප්‍රවේශයට උද්දේශනය සහ ජාලකරණය අන්තරස්ථ වන අතර, හිමිකම් උල්ලංඝනය සහ රජයේ අසාධාරණ ප්‍රතිපත්ති සහ භාවිතයන් ආමන්ත්‍රණය කිරීමට අත්‍යාවශ්‍ය වේ. අපගේ මානව හිමිකම් ව්‍යාපාරවලට, ප්‍රාදේශීය සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ මානව හිමිකම් ආරක්ෂකයින්, වෘත්තීය සමිති, යෞවන කණ්ඩායම්, කලාකරුවන්, මාධ්‍යවේදීන් සහ මාධ්‍ය හිමිකම් ක්‍රියාකාරීන්, ආගමික කණ්ඩායම්/නායකයින් මෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධානය සහ කේවල් කරන්නන් සමග ජාලගතවීම අයත් වේ. ජාලගතවීම, සන්දර්භයට විශේෂිත වූ ගැටළු සහ අභියෝග ආමන්ත්‍රණය කිරීමට ඒකාබද්ධ උත්සාහයන් සඳහා අවස්ථාවන් සපයයි. අතීතයේදී රයිට් ටූ ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ නැගී එන දේශපාලනික අභියෝග ආමන්ත්‍රණය කිරීමට විවිධ සිවිල් සමාජ ජාල තුළ කැඳවුම්කරුවෙකු සහ ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස මුලික වී ඇත. වෙනසක් සඳහා ඒකාබද්ධ සහ පැහැදිළි හඬක් නිර්මාණය කිරීමට අපි නොනවත්වා කටයුතු කරන අතර, මානව හිමිකම් ප්‍රවර්ධනය, සුරැකීම සහ තහවුරු කිරීම වැඩිදියුණු කිරීමේදී, ජාතික සහ ජාත්‍යන්තර මට්ටම්වල සාමුහිකව ව්‍යාපාරයක යෙදෙමු.

## 10. අපගේ ඉලක්ක ප්‍රදේශ




- *R2L* වර්තමානයේ වැඩකරන දිස්ත්‍රික්ක
- *R2L* වැඩකිරීමට සැලසුම් කර ඇති

රයිට් ටූ ලයිෆ් 2006 වසරේ පටන් පුත්තලම, ගම්පහ, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක තුළ කටයුතු කර ඇත. පසුව අපි අපගේ වැඩකටයුතුවල භූගෝලීය විෂය පථය පුළුල් කර කුරුණෑගල, මහනුවර, අනුරාධපුරය, වව්නියාව, මන්නාරම, බදුල්ල, ගාල්ල යන දිස්ත්‍රික්ක ඇතුළත් කරන ලද අතර, ඉදිරියේදී මොණරාගල දිස්ත්‍රික්කය තුළ කටයුතු කිරීමට අපේක්ෂා කරමු.

## 11. සංවිධානයික ව්‍යුහය

